www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද අයවැය සම්මත කර ගැනීමට ජවිපෙ ශ්‍රී ලංකාණ්ඩුවට සහාය දෙයි

## JVP assists the Sri Lankan government to pass its war budget

**කේ. රත්නායක විසිනි**
**2007 දෙසැම්බර් 20**

පසු ගිය සිකුරාදා පැවති තුන් වන සහ අවසන් පාර්ලිමේන්තු ඡන්ද විමසීමේ දී සිය යුද අයවැය සම්මත කර ත්නට ශ්‍රී ලංකාණ්ඩුව සමත් විය. ඒ සඳහා එය පදනම් වූයේ ජනතා විමුක්ති පෙරමුනෙන් (ජවිපෙන්) ලද සහාය මත යි. අයවැයට එරෙහිව ඡන්දය දෙනවා වෙනුවට දෙවන වටයේ ඡන්ද විමසීමේ දී ඡන්දය දීමෙන් වැලකී සිටීම මගින්, අස්ථාවර පාලක සන්ධානය බේරා ගැනීමට ජවිපෙ පැමිනියේ ය.

ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීන් 37 දෙනෙකු ඡන්දය දීමෙන් වැලකුනු තතු යටතේ අවසන් ඡන්ද විමසීමේ දී අයවැයට පක්ෂව ප්‍රකාශ වූ ඡන්ද සංඛ්‍යාව 114ක් වූ අතර, 67ක් ඊට විරුද්ධව ප්‍රකාශයට පත් විය. රට තුල පවතින ප්‍රතිගාමී සිවිල් යුද්ධය උත්සන්න කිරීමට පමනක් නො ව මිල ඉහල දැමීම් සහ සහනාධාර සහ සේවාවන් කප්පාදු කිරීම් තුලින් එහි සියලු බර වැඩ කරන ජනතාවගේ කර මත පටවන අයවැයක් සම්මත වීම සම්බන්ධයෙන් දිගින් දිගට ම කම්කරුවන්ගේ සහ දුප්පතුන්ගේ ආරක්ෂකයකු ලෙස පෙනී සිටින ජවිපෙ දැන් දේශපාලනිකව වගකිව යුතු ය.

2006 ජුලි මාසයේ දී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි ප්‍රහාර දියත් කිරීම ඇරඹූ වත්මන් ආන්ඩුව මිලිටරි වැයට අදාලව රුපියල් බිලියන 166ක (එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5ක) වාර්තාගත මුදලක් වෙන් කොට ගෙන තිබේ. පසු ගිය වසරේ වාර්තාව සමග සසඳන කල මෙය සියයට 20ක වැඩි වීමකි. ආරක්ෂක සහ මුදල් ඇමති තනතුරු හොබවන ජනාධිපති මහින්ද රාජපක්ෂ යුද වියදම් ගෙවීම සඳහා නව වක්‍ර බදු ගනනාවක් පනවා ඇති අතර සමාජ වියදම් කපා හැර තිබේ.

එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) හැරුනු විට, සියලු විරුද්ධ පක්ෂ එක් හෝ අනෙක් ආකාරයකින් යුද්ධයට සහාය දෙයි. ඒ අතරවාරයේ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාපය), ජීවන තත්ත්වයන් පිරිහීම මත පැන නැගෙන වැඩෙන මහජන කෝපය සිය වාසියට හරවා ගනු පිනිස අයවැයට විරුද්ධ විය. රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් (ශ්‍රීලනිපයෙන්) පලා ගිය ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් දෙදෙනෙකුගේ සහාය ලද එජාපය, අයවැය පරාජය කොට නව පාර්ලිමේන්තු මැතිවරනයක් පැවැත්වීම සඳහා බල කරන්නට අපේක්ෂා කලේ ය.

පාර්ලිමේන්තු සමීකරනයේ ප්‍රධාන අවයවය වූයේ ජවිපෙ යි. ජවිපෙ ඡන්ද සංඛ්‍යාව ප්‍රමානවත් නොවුවද අයවැයට එරෙහිව පැහැදිලි ස්ථාවරයක් ප්‍රකාශයට පත් වූයේ නම්, පාලක සන්ධානයේ අස්ථාවර සාමාජිකයන් පිල් මාරු කිරීම සඳහා දිරිමත් වන්නට ඉඩ තිබුනි. අයවැය ජවිපෙ අර්බුදයට ඇද දමා ඇත. එක් අතකින් එය දැඩිව "දේශප්‍රේමී" යුද්ධය තීව්‍ර කල යුතු යැයි ඉල්ලා සිටියි. අනෙක් අතට එය වැඩ කරන ජනතාව මුහුන දී සිටින අවාසනාවන්ත තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා පියවර ගත යුතු යැයි මැත දොඩමින් විටින් විට තමන් සමාජවාදීන් යැයි කියා පායි.

නොවැම්බර් 19 දා පැවති අයවැය දෙවන වර කියවීමට පූර්වයෙන් සති ගනනාවක් තිස්සේ වසන් කරමින් සිටි ජවිපෙ තුල පවතින බෙදීම් අවසානයේදී හෙලිදරව් විය. අයවැය දෙවනවර කියවීමේදී ආන්ඩුව යන්තම් ඡන්දය දිනා ත්තේ ජවිපෙ ඊට එරෙහිව ඡන්දය දීමෙන් අනතුරුව ය. අයවැය තුන් වන වර කියවීමට පූර්වයෙන්, ආර්ථිකමය බර පැටවීම් ඉවත් කරන්නට නො ව එල්ටීටීඊය නීති විරෝධී තත්ත්වයට පත් කිරීම ද ඇතුලුව යුද්ධය සම්බන්ධයෙන් වඩා දැඩි ආස්ථානයක් ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ජවිපෙ ඉල්ලීම් මාලාවක් ප්‍රකාශයට පත් කලේ ය. රාජපක්ෂ 2002 සටන් විරාමය ඉරා දැමිය යුතු යැයි ජවිපෙ විශේෂයෙන් අවධාරනය කලේ ය. නමට පමනක් පැවති මෙම සටන් විරාමය ඉරා දැමිය යුතු යැයි ජවිපෙ කල මෙම ඉල්ලීම, තමන් තව මත් ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියා දාමයට සහාය දක්වන්නේ යැයි කියා පාන්නට ආන්ඩුවට ඉඩ ලබා දුනි.

හොර රහසේ, අයවැයට එරෙහිව ඡන්දය දීම වැලැක්වීම සඳහා තමන්ගේ ම මන්ත්‍රීන්ට අල්ලස් දෙන්නට හා බලපෑම් කරන්නට ආන්ඩුවට බල කෙරුනි. ඡන්ද විමසීමට දින හතරකට පෙර, මිලිටරිය සමග එක් වූ සන්නද්ධ කන්ඩායමක් දෙමල ජාතික සන්ධානයේ මන්ත්‍රීන් තිදෙනෙකුගේ ඥාතීන් පැහැර

ගෙන ගොස්, පාර්ලිමේන්තු මන්ත්‍රීන් තිදෙනා අයවැයට එරෙහිව ඡන්දය දුන හොත් ඔවුන් ඝාතනයට ලක් වනු ඇතැයි නිවේදනය කලහ. එම මන්ත්‍රීහු තිදෙන, එනම් පී. අරියනේත්‍රන්, කේ. තංගේෂ්වරී සහ එස්. ජෙයනන්දමූර්ති, ඡන්දය දීම සඳහා පාර්ලිමේන්තුවේ නො සිටියහ.

එජාපය ද ආන්ඩුවේ මන්ත්‍රීන්ගේ සහාය දිනා ගැනීමේ අතිකාල වැඩවල යෙදී සිටියේ ය. ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ (ශ්‍රීලංමුකො) නායක රවුෆ් හකීම් සහ නියෝජ්‍ය ඇමතිවරු තිදෙනෙක් ආන්ඩුවෙන් ඉල්ලා අස් වී විපක්ෂයට එක් වූහ. විශේෂයෙන් ම නැගෙනහිර මුස්ලිම් ජනයාට එරෙහිව වෙනස්කම් කිරීම සම්බන්ධයෙන් හකීම් ආන්ඩුවට චෝදනා කලේ ය. පසු ගිය සිකුරාදා, එනම් අවසන් ඡන්ද විමසීම දා, ප්‍රමුඛ ශ්‍රීලනිප සාමාජිකයෙකු සහ කැබිනට් ඇමතිවරයෙකු වන අනුර බන්ඩාරනායක විපක්ෂයට පලා ගියේ ය.

මධ්‍යම කඳුකරයේ දිස්ත්‍රික්කවල වෙසෙන දෙමල බස කතා කරන වතු කම්කරුවන් අතර පදනම් වී සිටින ලංකා කම්කරු කොන්ග්‍රසය (සීඩබ්ලිව්සී) සහ කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) විපක්ෂයට මාරු වීම සඳහා සූදානම් වෙමින් සිටි බවට ලකුනු ද පැවතුනි. යූපීඑෆ් සාමාජික වී. රාධාක්‍රිෂ්නන් පාර්ලිමේන්තුවේ දී කියා සිටියේ, "ජනතාවට ඕන කෙරුවෙ ඔවුන් [ඔහුගේ පක්ෂය] අයවැයට විරුද්ධව ඡන්දෙ දෙන එක". මින් අදහස් වූයේ තවත් ඡන්ද දෙකක් අහිමි වීමට තිබූ බව යි.

මේ තතු තුල, අයවැය පරාජයට පත් කිරීම ජවිපෙ ඡන්දය මත රඳා පැවතුනි. අවසන් මොහොත දක්වා ම, පසු ගිය මාසයේ කලාක් මෙන් ම තමන් අයවැයට එරෙහිව ඡන්දය දෙන බවට ජවිපෙ නායකයෝ ප්‍රකාශ කරමින් සිටියහ. සිකුරාදා පවා, පක්ෂයේ අවන් විදුලි මධ්‍යස්ථානයට (වී එෆ්එම්) කතා කරමින් ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහතික කලේ, විරුද්ධ පක්ෂය සමග එක් වී ඡන්දය දෙන්නට නායකත්වය තීරනය කොට ඇති බව යි.

කෙසේ වුව ද, සිකුරාදා හවස් යාමයේ ජනාධිපතිගේ සොහොයුරා වන බැසිල් රාජපක්ෂ සමග පැවැත්වූ කතාබහෙන් අනතුරුව ජවිපෙ සිය ස්ථාවරය වෙනස් කලේ ය. නේෂන් පුවත්පත මෙසේ වාර්තා කලේ යඃ "ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ඉහල පෙලේ පාර්ලිමේන්තු සාමාජිකයන් සහ ජනාධිපති උපදේශක බැසිල් රාජපක්ෂ අතර සිකුරාදා සවස 2ට පාර්ලිමේන්තුවේ දී පැවති රහස් සාකච්ඡාව, තමන් සිකුරාදා පැවැත්වෙන තීරනාත්මක අයවැය ඡන්ද විමසීමේ දී ඡන්දය දීමෙන් වැලකී සිටිනු ඇත යන ජවිපෙ නිවේදනය නිකුත් වන්නට හේතු විය."

පිල් මාරු කිරීම ගැන සිතා බලමින් සිටි අය ඉක්මනින් තම සිත වෙනස් කර ත්හ. සීඩබ්ලිව්සීය සහ යූපීඑෆ්ය සිතමින් සිටියේ ආන්ඩුව අත හැර යාම ගැන නො ව, කෙසේ හෝ අයවැය සම්මත වන්නට යන්නේ නම් තමන්ගේ ඇමති වරප්‍රසාද අත හරින්නට යි. අයවැය පිලිබඳ අවසන් ඡන්ද විමසීමට පූර්වයෙන් වෙන් වූ අංගයක් වශයෙන් ගත් ආරක්ෂක වියදම් සම්බන්ධයෙන් කල මුදල් වෙන් කිරීම්වලට පක්ෂව ජවිපෙ ඡන්දය දුන්නේ යුද්ධයට තම සහාය මතු කර පෙන්වීම සඳහාය. අයවැය අනුමත වීමෙන් අනතුරුව බැසිල් රාජපක්ෂ විශ්වාසයෙන් යුතුව ජවිපෙට තුති පිදී ය.

ජවිපෙ ස්ථාවරය යුක්ති සහගත කරමින් ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ සෙනසුරාදා පුවත්පත්වලට කියා සිටියේ මෙය යිඃ "එජාපය ලබන විජයග්‍රහනයක් එල්ටීටීඊයට එරෙහිව ආරක්ෂක හමුදා ගෙන යමින් සිටින යුද ව්‍යාපාරයට ව්‍යසනකාරී බලපෑමක් ඇති කරාවි. අවුල් ජාලාවල්, දේශපාලනික අස්ථාවරත්වය ඇති වේවි. ඒක සතුරාට වාසියක් වේවි. ජවිපෙ අභිලාෂය වෙන්නෙ, විශේෂයෙන් ම සාර්ථක මිලිටරිමය යුද ව්‍යාපාරයේ ආස්ථානයෙන් ස්ථාවරභාවය සහතික කරන එක, අයවැය පරාජය කිරීමේ අවශ්‍යතාව අහිබවා යාම, ඒ විදියට ආන්ඩුව හෙලීම".

අමරසිංහගේ ප්‍රකාශයෙන් වෙලුම් ගනනක කරුනු කියැවෙයි. මේ පක්ෂය වැඩ කරන්නේ යුද්ධය ගැඹුරු කරන්නට යි, ධනපති පාලනයේ සහ ශ්‍රී ලාංකික රාජ්‍යයේ ස්ථාවරත්වය පවත්වාගෙන යන්නට යි. අමරසිංහ "පලමුව මව්බිම" යන දිගු කාලීන ස්වෝත්තමවාදී ජවිපෙ සටන් පාඨය යලි පදගත කරනවා පමනකි. 24 වසරක් තිස්සේ පැවත එන මෙම වාර්ගික යුද්ධය සඳහා තමන්ගේ ජීවිත සහ ජීවන තත්ත්වයන් කැප කරන්නට බල කෙරෙන්නේ වැඩ කරන ජනතාවට සහ ඔවුන්ගේ දූපුතුන්ට යි.

අයවැයට ඡන්දය දීම අගයමින් ආරක්ෂක අමාත්‍යාංශය නිකුත් කල ස්වෝත්තමවාදී පුවත්පත් නිවේදනය සමග ජවිපෙ ස්ථාවරය මුලුමනින් ම එක පෙලට පිහිටියේ ය. "... අයවැය පිලිබඳ ඡන්ද විමසීමේ දී ආන්ඩුව පරාජය වනු දැකීමේ දැවැන්ත ම අභිලාෂයෙන් සිටි වී. ප්‍රභාකරන් [එල්ටීටීඊ නායකයා] ත්‍රස්තවාදී නායකයෙකු මිස අනෙකෙක් නො වේ. ත්‍රස්තවාදයට අනුග්‍රහ දක්වන්නන්, ද්‍රෝහී දේශපාලනඥයන් සහ මාධ්‍ය හසුරුවන්නන් අසාර්ථක වීම සාමයට කැමති සියලු ශ්‍රී ලාංකිකයන් ලද දැවැන්ත ජයග්‍රහනයක් බව නිසැක ය" යි එය කියා සිටියේ ය.

අයවැයට සහාය දීම සඳහා ජවිපෙ ගත් තීරනය මගින් කම්කරුවන් හමුවේ එය කරන මවා පෑම එලිදරව් වී තිබේ. ඡන්දය දීමෙන් වැලකීමේ තීරනය න්නට පූර්වයෙන් දෙසැම්බර් 11 දා, ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.ඩී. ලාල් කාන්ත ලංකා තැපැල් සේවා

වෘත්තීය සමිතියේ (එල්පීඑස්යූ) වාර්ෂික රැස්වීමේ දී මැත දෙඩුවේ "ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය තුල බලයට පත් අතිශයින් ම දූෂිත, අකාර්යක්ෂම සහ දුෂ්ට ම ආන්ඩුව" රාජපක්ෂ ආන්ඩුව බව යි. "ඉහල ම මට්ටමේ සිට පහල ම මට්ටම දක්වා සිටින මුලුමහත් පාලක ධුරාවලීන් ම දූෂිත ය, දුෂ්කලමනාකරනය සම්බන්ධ වැරදිකරුවන් ය".

අයවැයට දුන් තම සහාය නිසා දුර්වල වී සිටින ජවිපෙ මත මේ ආන්ඩුව දැන් වඩාත් රඳා පවතියි. කෙසේ වුව ද, පසුපසට පියවර තබනවා වෙනුවට ජවිපෙ "පලමුව මව්බිම" යන සිය වාර්ගික උද්ඝෝෂනය තීව්‍ර කරනු ඇත. අතීතයේ දී කර ඇත්තාක් මෙන්, යුද්ධයට විරුද්ධ වන්නන්ට එරෙහිව තර්ජන සහ කායික ප්‍රචන්ඩත්වය යොදා ගන්නට ජවිපෙ පසුබට නොවනු ඇත.

© www.wsws.org